කාර්ය සාධන වාර්තාව

2020

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමන්ගේ පණිවුඩය



ශ්‍රී ලාංකේය ජන සමාජයේ උන්නතිය උදෙසා බිහි වූ සමුපකාර ව්‍යාපාරය නඟා සිටුවීම සඳහා කැපවන සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) 2020 වර්ෂය සඳහා සකසනු ලැබූ කාර්ය සාධන වාර්තාව ඔබ අතට පත් කරනු ලබන්නේ ඉමහත් සතුටිනි.

"ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය" යන්න දැක්ම කර ගනිමින් සමුපකාර ව්‍යාපාරයේ දියුණුව සඳහා පුළුල්ව මැදිහත් වීම, මෙහෙවර කර ගත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව ලාංකේය සාමාන්‍ය ජන ජීවිතය හා අවියෝජනීයව බැඳී පවතී. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) ව්‍යුහය හා කාර්යභාරය පිළිබඳවත් අභ්‍යන්තර පරිපාලනය, මානව සම්බන්ධතා සංවර්ධනය සහ විගණන කටයුතු, නීති කටයුතු පිළිබඳවත් මෙම වාර්තාව මඟින් ඉදිරිපත් කර ඇත.

2020 වර්ෂයේ රට තුළ පැවති අර්බුදකාරී කොවිඩ් 19 වෛරසය ව්‍යාප්තිය හමුවේ මෙම දෙපාර්තමේන්තුව ජනතා ව්‍යවසායෙකු ලෙස නැඟී සිටීමට හැකියාව ලැබීම අප ලද සුවිශාල භාග්‍යයක් කොට සලකමි. සමුපකාරය "එකා සැමටත් සැම එකාටත්" යන්න පසක් කරමින් කොවිඩ් අර්බුද සමයේ අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදා හැරීමට දායක වීම මෙම වසර තුළ සිදු වූ සුවිශේෂීම සිදුවීම ලෙසින් සැලකීමට හැකියාව ඇත.

මෙවන් විපුල මෙහෙවරක නිරත සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සමුපකාර ව්‍යාපාරය තුළ නියමු කාර්යභාරයක් ඉටු කරනු ලබන අතර, මෙම දෙපාර්තමේන්තුව පිළිබඳ පහසු අවබෝධයක් වාර්තාව පරිශීලනය කිරීම මඟින් ලබා ගැනීමේ හැකියාව ඇත.

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි සියළු කාර්යයන් 2020 වර්ෂයේ දී සාර්ථක කර ගැනීම සඳහා සහයෝගය දැක් වූ සැමට මාගේ කෘතඥතාවය පළ කරන අතර, විවිධ අභියෝගයන් හා බාධක හමුවේ මෙහෙවර ඉටු කිරීම සඳහා වර්ෂය තුළ දායකත්වය දැක් වූ ගරු වෙළඳ අමාත්‍යතුමා, වෙළඳ අමාත්‍යාංශ ලේකම්තුමිය, සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා, සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශ ලේකම්තුමා, පළාත් කොමසාරිස්වරුන් හා මෙම දෙපාර්තමේන්තුවේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු සමස්ත කාර්ය මණ්ඩලයට හා දිවයින පුරා විසිරි පවතින සියලුම සමුපකාර සමිති වෙත මාගේ ස්තූතිය පුද කරමි.

ශ්‍රී ලාංකික ප්‍රජාවගේ මෙන්ම ලෝක ප්‍රජාවගේ ද තිරසාර සංවර්ධන අපේක්ෂාවන් සාක්ෂාත් කිරීම සඳහා ශක්තිය ධෛර්ය හා අවකාශයන් සියළුම සමුපකාරිකයන්ට ලැබේවා යි ප්‍රාර්ථනා කරමි.

සුවින්ද එස්. සිංගප්පුලි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්

පටුන

*සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් තුමන්ගේ පණිවුඩය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3 ප්‍රධාන කාර්යන්

1.4 සංවිධාන සටහන

1.5 දෙපාතර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

03 පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

3.2 මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

3.8 මූල්‍ය නොවන වෙනත් වත්කම් වාර්තාකිරීමේ කාර්ය සාධනය

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව 2020.12.31 දිනට ප්‍රගතිය

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

06 පරිච්ඡේදය

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

6.3 මානව සම්පත් සංවර්ධනය

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

සියවසකට ආසන්න කාලයක් පුරා ශ්‍රී ලාංකික ජන සමාජයේ උන්නතිය උදෙසා සුවිශේෂී ප්‍රතිපත්ති හා ආචාරධර්ම අනුව ක්‍රියාත්මකවන සමුපකාර ව්‍යාපාරය, වෙළඳපොල අභියෝග හමුවේ තම අරමුණු ළඟා කර ගැනීමට අපහසු ප්‍රජාව සවිබල ගන්වමින් ඔවුන්ගේ ආර්ථික සාමාජීය හා සංස්කෘතික අවශ්‍යතා ඉටුකර දීමට එක් වී සිටියි. මෙවන් අරමුණු පෙරදැරිව 1930 ඔක්තෝම්බර් මස 01 වන දින සමුපකාර දෙපාර්තමේන්තුව ආරම්භ කරන ලද අතර කාර්යභාරය වඩාත් පුළුල් කරමින් 1945 වර්ෂයේ දී ‘‘සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව’’ ලෙස ස්ථාපිත කරන ලදී. එය වර්තමානයේ දී සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව අංක 330, යූනියන් පෙදෙස, කොළඹ 02 දරණ ස්ථානයේ පිහිටා ඇත.

සමුපකාර ව්‍යාපාරයේ උන්නතිය උදෙසා කැපවීමෙන් කටයුතු කරනු ලබන මෙම දෙපාර්තමේන්තුව සමුපකාර ව්‍යාපාරය සඳහා අවශ්‍ය මඟ පෙන්වීම මෙන්ම ඒ සඳහා අවශ්‍ය සුවිශේෂී ප්‍රතිපත්ති සහ සැලසුම් ගොඩනගමින් ‘‘සෞභාග්‍යයේ දැක්ම’’ ප්‍රතිපත්ති ප්‍රකාශය මුදුන් පමුණුවා ගැනීමට මහත් කැපවීමෙන් කටයුතු කරන අතර ඒ සඳහා අවශ්‍ය කාර්ය මණ්ඩලය වෙත නායකත්වය ලබා දීමේ වගකීම සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර් සුවින්ද එස්. සිංගප්පුලි මහතා විසින් නොපිරිහෙලා ඉටු කරනු ලබයි.

අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති සංගම් ලියාපදිංචි කිරීම සහ ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම්වල කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාළ කටයුතු සිදුකිරීමද මෙම දෙපාර්තමේන්තුවේ මූලික කාර්ය භාරයකි. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සමීබන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාරයේ කටයුතු මෙහෙයවීම, ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහයවීම ඇතුළු රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීමද මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබයි.

රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 යටතේ සකස් කරන ලද සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 වාර්ෂික කාර්යසාධන වාර්තාව මෙමඟින් ඉදිරිපත් කෙරේ.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව

දැක්ම

ජනතා ව්‍යවසායක් ලෙස තිරසාර සංවර්ධනයට සමුපකාරය

මෙහෙවර

ශ්‍රී ලංකාවේ සමුපකාර ව්‍යාපාරය
ජනතා ව්‍යවසායක් ලෙස සංවර්ධනය කිරීම සඳහා
සානුබල සපයමින්
සමුපකාර සමිතිවල යහ පාලනය
ගොඩ නැඟීම සඳහා
පුළුල් ලෙස මැදිහත් වීම.

1.3 ප්‍රධාන කාර්යන්

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන්

i. අන්තර් පළාත් හා සමස්ත ලංකා මට්ටමේ සමුපකාර සමිති සංගම් ලියාපදිංචි කිරීම
ii. ලියාපදිංචි සමුපකාර සමිති හා සංගම්වල කටයුතු මෙහෙයවීම සහ සංවර්ධනයට අදාළ කටයුතු සිදුකිරීම
iii. පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු හා සම්බන්ධීකරණය වෙමින් ජාතික ප්‍රතිපත්තියක් තුළ සමුපකාරයේ කටයුතු මෙහෙයවීම
iv. ජාතික සමුපකාර සංවර්ධන ක්‍රියාදාමයන්ට සහයවීම
v. රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා සංවර්ධනාත්මක දායකත්වයක් සැපයීම

අනෙකුත් කාර්යයන්

i.සමුපකාර සමිති ව්‍යවස්ථාපිත කටයුතු

i. සමිති ලියාපදිංචි කිරීම
ii. සමිති ඒකාබද්ධ හා විබද්ධ කිරීම
iii. සාමාජිකත්වය පිළිබඳ කටයුතු
iv. අතුරු ව්‍යවස්ථා හා සංශෝධනයන් අනුමත කිරීම
v. නිලවරණ කටයුතු අධීක්ෂණය
vi. මහ සභා කැඳවීම / කාරක සභා කැඳවීම හා වලංගුභාවය තීරණය කිරීම
vii. ලියාපදිංචි සමුපකාර සමිති විසුරුවා හැරීම
viii. තීරකකරණ කටයුතු සහ උසාවි බල ගැන්වීම්
ix. සමුපකාර සමිති / සංගම්වල වාර්ෂික විගණනයන් සිදුකිරීම

ii.කළමනාකරණ කටයුතු

1. පාලක මණ්ඩල පත් කිරීම / අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් පත් කිරීම
2. ගිණුම් කටයුතු පිළිබඳ අධීක්ෂණය
3. විගණනය

4. පනතේ විධිවිධාන පරිදී සාමාන්‍ය / විශේෂ විභාග හා පරීක්ෂණ පැවැත්වීම
5. කළමනාකරණ අධ්‍යාපනය සහ උපදෙස් දීම

iii. සම්බන්ධීකරණ කටයුතු

- සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය හා වෙනත් රාජ්‍ය ආයතන සහ පෞද්ගලික ව්‍යවසායන් සමඟ සම්බන්ධීකරණය
- පළාත් සමුපකාර අමාත්‍යවරුන්, අමාත්‍යාංශ ලේකම්වරුන් හා පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්වරුන් සමඟ සම්බන්ධීකරණය සඳහා සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ පරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයට සහයවීම
- ජාත්‍යන්තර සමුපකාර සංධානය සහ විදේශීය සමුපකාර ආයතන සම්බන්ධීකරණය
- සමුපකාර ග්‍රාමීය බැංකු හා සමුපකාර මූල්‍ය ආයතන පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ සම්බන්ධීකරණය
- සමුපකාර සමිති වලට අදාළ සංඛ්‍යා ලේඛණ පිළිබඳව මහ බැංකුව හා ජන ලේඛනණ හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය
- අවශ්‍ය අවස්ථාවන්හි දී රජයේ සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා රජය වෙනුවෙන් සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
- සමුපකාර සමිති / සංගම් අතර සම්බන්ධීකරණය

iv. සංවර්ධන කටයුතු

- වාර්ෂික අය වැය ප්‍රතිපාදන අනුව ජාතික මට්ටමේ සහ පළාත් මට්ටමේ සංවර්ධන කාර්යයන් ඉටු කිරීම
- සමුපකාර සමිතිවල යහ පාලනය සහතික කිරීමට අදාළ කටයුතු ඉටු කිරීම
- සමුපකාර සමිති හා සංගම්වල සංවර්ධනය සඳහා සංවර්ධන උපදේශන සේවා සැපයීම
- සමුපකාර සමිති හා සංගම්වල මූල්‍ය හා මෙහෙයුම් ක්‍රියාකාරකම් අධීක්ෂණය
- සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
- සංවර්ධන ආධාර හා සානුබල සැපයීම
- සංවර්ධන මාර්ගෝපදේශ සැපයීම හා සම්බන්ධීකරණය
- සමුපකාර ක්ෂේත්‍රයේ සහ දෙපාර්තමේන්තුවේ මානව සම්පත් සංවර්ධනය
- සේවක / නිලධාරී සුභසාධනය

v. අරමුදල් පාලනය

- දෙපාර්තමේන්තුව යටතේ ඇති සමුපකාර අරමුදල සහ සමුපකාර අතිරික්ත අරමුදල කළමනාකරණය හා පාලනය
- ව්‍යවස්ථාපිත සමිතිවල වාර්ෂික විගණනයෙන් පසු වෙන් කරනු ලබන දායක මුදල් අය කර ගැනීම
- සමුපකාර සමිතිවල සංවර්ධන ව්‍යාපෘති හා පුහුණු කටයුතු සඳහා ණය සහ ආධාර ලබාදීම
- ණය ආපසු අය කර ගැනීම
- ඵලදායී ලෙස අරමුදල් ආයෝජනය කිරීම

vi. අභ්‍යන්තර පරිපාලන හා කළමනාකරණ කටයුතු

- සාමාන්‍ය පරිපාලනය
- මානව සම්පත් කළමනාකරණය
- කාර්ය සාධනය වර්ධනය
- වත්කම් කළමනාකරණය

1.4 සංවිධාන සටහන

සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු සංවිධාන ව්‍යුහය



1.5 දෙපාතර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල

දෙපාතර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාල කිසිවක් නොමැත.

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන/ අරමුදල්

සමුපකාර සංවර්ධන අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

සමුපකාර අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(3) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44(i) සිට 44(iii) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඇවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණයහිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අය විය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වේ.

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

දෙපාර්තමේන්තුව යටතේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති නොමැත.

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2020 වර්ෂයේ වැදගත් සිදුවීම්

මෙම දෙපාර්තමේන්තුවෙහි පරිපාලන ව්‍යුහයෙහි 2020 වසර තුල සිදු වූ සුවිශේෂී සිදුවීම් කිහිපයකි.

ජනතා කේන්ද්‍රීය ආර්ථික දැක්මක් සමඟින් නව රජයේ සමුපකාර ක්ෂේත්‍රයට පුළුල් අවශ්‍යතාවයක් වෙන් කර ඇති බැවින්, සමුපකාර ව්‍යාපාරයේ ප්‍රගමනය උදෙසා නව ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කිරීම ආරම්භ කිරීම මෙම වර්ෂයේ සිදුවිය. එහි දී දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීම දැඩි අවශ්‍යතාවයක් විය.

2020 වර්ෂයේ මැද භාගයෙහි ගණකාධිකාරී තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරිනියක ස්ථීර පත්වීමක් ලැබූ අතර, දෙපාර්තමේන්තුවේ නීති නිලධාරි තනතුර සඳහා නව නිලධාරිනියක බඳවා ගැනීම ද 2020 වර්ෂයෙහි අගබාගයේ සිදුවිය.

තවද කළමනාකරණ සේවා නිලධාරී I ශ්‍රේණියේ නව පත්වීම් ලබා ගත් නිලධාරීන් සහ කාර්යාල කාර්ය සහයක III ශ්‍රේණියේ නව පත්වීම් ලැබූ නිලධාරීන් කිහිපදෙනෙකු 2020 වර්ෂයේ මෙම දෙපාර්තමේන්තුවේ සේවයට එක් වූ අතර, සංවර්ධන නිලධාරීන් සහ කළමනාකරණ සේවා නිලධාරීන් වරින්වර ස්ථාන මාරු වී යාමත් ස්ථාන මාරු ලබා මෙම දෙපාර්තමේන්තුවට පැමිණීමත් 2020 වර්ෂයේ අවස්ථා කිහිපයක දී සිදුවිය.

දෙපාර්තමේන්තුව මඟින් ඉටු කරනු ලබන කාර්යයන් වඩාත් කාර්යක්ෂමව හා ඵලදායීව ඉටුකිරීමට දෙපාර්තමේන්තුව උත්ශ්‍රේණිගත කිරීම් සඳහා අංශ ප්‍රතිව්‍යුහගත කිරීම සිදුකල අතර, බඳවාගැනීම් කටයුතු කඩිනමින් සිදු කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

ඒ අනුව සේවාවන් කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා අභ්‍යන්තර පිරි සැකැස්ම ඉඩකඩ උපරිම ලෙස භාවිතයට ගත හැකි වන පරිදි නැවත සකස් කර ඇත. උසස්වීම් අවස්ථා ජ්‍යෙෂ්ඨත්වයට මෙන්ම, සුදුසුකම්ලත් නිලධාරින්ට ද හිමිවනසේ දෙපාර්තමේන්තුගත සේවයේ බඳවාගැනීම් පරිපාටි සංශෝධනය කිරීම ආරම්භ කරන ලදී. 2020 වර්ෂයේ ඇති වූ හදිසි වසංගත අවදානම් තත්ත්වය හමුවේ වුවද නිලධාරීන් සීමිත සංඛ්‍යාවක් මඟින් කාර්යාල කටයුතු අඛණ්ඩව පවත්වා ගැනීමට විධි විධාන සලසමින් සේවාවන් සැපයීම සිදුකර ඇත. එමෙන්ම විනිවිදභාවයෙන් හා කාර්යක්ෂම සේවා සැපයීමක් සඳහා සේවාලාභී ප්‍රඥප්තිය සකස්කර අවසන් කරන ලදී.

එහෙත් 2020 වර්ෂයේ අනපේක්ෂිතව ඇති වූ කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ මෙම දෙපාර්තමේන්තුවේ අරමුණු /ඉලක්ක 100% ක් සපුරා ගැනීමට හැකියාවක් නොමැති වූව ද, පැවති තත්ත්වය හමුවේ මෙම දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇති කාර්යභාරය උපරිම කාර්යක්ෂමතාවයෙන් ඉටුකරන ලදී. තව ද කෝවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් රට වසා දමා පැවති සමයේ අත්‍යාවශ්‍ය ආහාර ද්‍රව්‍ය බෙදාහැරීමේ රාජ්‍ය යාන්ත්‍රනය තුළ ප්‍රමුඛස්ථානය ගෙන කටයුතු කිරීමට ලැබීම 2020 වර්ෂයේ දෙපාර්තමේන්තුව ලද විශේෂ අවස්ථාවකි.

නව පත්වීම්/ ස්ථාන මාරු ලබා පැමිණි නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	නව පත්වීම/ ස්ථාන මාරු ලැබූ දිනය
01	ඩබ්.පී.ඒ.පී.ඩබ්. පතිරණගේ මයා	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර III	2020.03.16
02	ඩබ්.එම්.අයි.ඒ.ඩී. විජයරත්න මෙය	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර III	2020.03.16
03	ඩබ්.ටී.එම්. ප්‍රියන්ති මිය	කළමනාකරණ සේවා නිලධාරී I	2020.02.25
04	එච්.ඒ.ආර්. අනුරුද්ධිකා මෙය	කළමනාකරණ සේවා නිලධාරී II	2020.02.25
05	ජී.එම්.එච්.කේ. ගම්ලත් මිය	කළමනාකරණ සේවා නිලධාරී III	2020.02.25
06	ආර්.ඒ.බී.එන්. රණසිංහ මිය	කළමනාකරණ සේවා නිලධාරී III	2020.09.25
07	ආර්.පී.ජේ. හැන්ටන් මයා	රියදුරු - අධිශ්‍රේණිය	2020.02.20
08	ඊ.වී.එන්. ප්‍රසන්න මයා	රියදුරු III	2020.05.11
09	එච්.පී.ජේ. පීරිස් මයා	රියදුරු III	2020.06.01
10	පී. ජයවීර මයා	කාර්යාල සේවක සේවය - අධිශ්‍රේණිය	2020.03.04
11	ආර්.ඩී.එම්.එස්.එම්.එස්. බණ්ඩාර මයා	කාර්යාල සේවක සේවය III	2020.02.20

ස්ථාන මාරුවී ගිය/ මුදාහරින ලද සේවය අවසන් කරන ලද නිලධාරීන්

අනු අංකය	නම	තනතුර	ස්ථාන මාරු වී ගිය දිනය
01	නිලංග ඩී. සෝමපාල මයා	ශ්‍රී ලංකා පරිපාලන සේවය III	2020.02.19
02	ඩබ්.ටී.එම්. ප්‍රියන්ති මිය	කළමනාකරණ සේවා නිලධාරී III	2020.06.09
03	අර්ජුන තාමරස මයා	කළමනාකරණ සේවා නිලධාරී II	2020.02.28
04	එන්.ඒ.එච්. පීරිස් මෙය	කළමනාකරණ සේවා නිලධාරී III	2020.03.02
05	ඩී.එම්.එස්.එන්. මධුෂානි මිය	කළමනාකරණ සේවා නිලධාරී III	2020.02.28
06	ඕ.ටී. විතානආරච්චි මිය	කළමනාකරණ සේවා නිලධාරී III	2020.09.25
07	එල්.ඒ.එස්.එස්. ලියනාරච්චි මිය	සංවර්ධන නිලධාරී III	2020.03.02
08	මහසෙන් කැටපෙආරච්චි මයා	රියදුරු I	2020.02.24
09	ඒ.ඩී.කේ.එස්. දහනායක මිය	කාර්යාල සේවක සේවය III	2020.08.17

කාර්ය මණ්ඩල විශ්‍රාම ගැන්වීම

අනු අංකය	නම	තනතුර	විශ්‍රාම ගිය දිනය
01	ලලිතා බස්නායක මිය	පරිපාලන නිලධාරී	2020.04.27
02	පුෂ්පා රන්ජනී මිය	ශාඛා ප්‍රධානී (පාලන)	2020.03.22

පුහුණු හා මාධ්‍ය අංශය

දේශීය පුහුණු

2020 වර්ෂය තුල දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල නිලධාරීන් පහත සඳහන් පරිදි දේශීය අධ්‍යාපන හා පුහුණු පාඨමාලා සඳහා සහභාගී කරවා ඇත.

	පුහුණු වැඩසටහන	සංවිධානය කළ ආයතනය	කාල සීමාව	සහභාගී වූ නිලධාරීන්
01	රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයන් සඳහා විනය කාර්යාලීය ආචාර විධි	SDFL	2020.01.23/24	එම්.එස්.ඒ. ෆර්සාද් මයා එස්.එම්. ශකීර් මයා එච්.ඒ. රෂිනි දිල්හාරා මිය
02	Capacity Building on Research and Data Analysis Using SPSS	කොළඹ විශ්ව විද්‍යාලය	2020.01.26 සිට ඉරිදා දින 04ක්	නිලංග ඩී. සෝමපාල මයා චන්දන ෆොන්සේකා මයා කේ.එල්.එස්. මල්කාන්ති මිය
03	රජයේ වැටුප් සැකසීම	මිලෝදා ආයතනය	2020.01.29/30/31	ඊ.එම්. බටගම මිය ඩී.එස්.යූ. විතාරණ මයා
04	රියදුරු මහතුන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම.	SDFL	2020.02.17/18	රුවින්ද තිලකරත්න මයා
05	How to prepare Procurement Plan and Action Plan	SDFL	2020.02.24/25/26	සනත් ද සිල්වා මයා අනෝජා සඳමාලි හේරත් මිය
06	විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව	SDFL	2020.07.27	එම්.අයි. සාරා මෙය එච්.කේ.ඒ.එල්. මධුෂාණි මෙය

විදේශීය පුහුණු

2020 වර්ෂය තුල දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩල නිලධාරීන් පහත සඳහන් පරිදි විදේශීය අධ්‍යාපන, පුහුණු ශිෂ්‍යත්ව හා සම්මන්ත්‍රණ සඳහා සහභාගී වී ඇත.

	නම	කාල පරිච්ඡේදය	පැවැත් වූ රට	වැඩසටහනේ නම
01	බී.ආර්. තරංගනී මිය	2020.02.01 – 2020.03.14	තායිලන්තය, ජපානය	ICA-Japan Training Course on “Fostering Leaders for Management & Development of Agricultural Cooperative of Asia 2019

මාධ්‍ය කටයුතු

සමුපදීපනී මාසික වාර ප්‍රකාශනය ජනවාරි සහ පෙබරවාරි මාස සඳහා නිකුත් කර ඇත.

සැලසුම්, සංවර්ධන, ප්‍රගති පාලන අංශය හා සමිති අංශය

සංවර්ධන ක්‍රියාකාරකම්

2020 වර්ෂයේ සමුපකාර සමිති ලියාපදිංචි කිරීම

	සමිතිය/ සංගමය නම	ලියාපදිංචි අංකය	ලියාපදිංචි කල දිනය
01	සී/ස හරිත ප්‍රජා ව්‍යවසායකයින්ගේ සමුපකාර සමිතිය	සමු 75	2020.09.30
02	සී/ස තාක්ෂණික ව්‍යවසාය හා කළමනාකරණ සමුපකාර සංවර්ධන බැංකු සමිතිය	සමු 76	2020.11.26

2020 වර්ෂයේ සමුපකාර සමිති/ සංගම්වල අතුරු ව්‍යවස්ථා සංශෝධනය කිරීම හා කාලීනව සංශෝධන සඳහා උපදෙස් ලබාදීම

	සමිතියේ / සංගමයේ නම
01	සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තු සේවකයින්ගේ සණස සමිතිය
02	සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය

2020 වර්ෂයේ සමුපකාර සමිති/ සංගම් නිලවරණ පැවැත්වීම

	සමිතියේ / සංගමයේ නම
01	සී/ස බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ අන්නෙය්‍යාධාර අර්ථසාධක අරමුදල් සමුපකාර සමිතිය
02	සී/ස ශ්‍රී ලංකාවේ සෞඛ්‍ය කාර්ය මණ්ඩල සංවර්ධන සේවා සමුපකාර සමිතිය
03	සී/ස ශ්‍රී මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන්ගේ සකසුරුවම හා ණය ගණුදෙනු හා සුභසාධක සමුපකාර සමිතිය
04	සී/ස වරාය අධිකාරියේ සේවක සුභසාධක සමුපකාර සමිතිය
05	සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැළැටි සහ උඩවැඩියා සමුපකාර සමිතිය
06	සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
07	සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය
08	සී/ස සමස්ත ලංකා අභ්‍යාස පොත් නිපදවන්නන්ගේ සමුපකාර සමිතිය
09	සී/ස සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය
10	සී/ස සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ සමුපකාර මහා සංගමය
11	සී/ස ශ්‍රී සමස්ත ලංකා විදේශ භාෂා අධ්‍යාපන ප්‍රවර්ධන සමුපකාර සමිතිය

වර්ෂය තුල ක්‍රියාත්මක වූ සමුපකාර සංගම්

ජාතික මට්ටමේ සමුපකාර සංගම් 13ක් වර්ෂය තුළ ක්‍රියාකාරී තත්ත්වයේ පැවති අතර, දෙපාර්තමේන්තුව විසින් එකී සංගම් හි කළමනාකරණ හා ව්‍යාපාරික කටයුතු සඳහා මහපෙන්වමින් හා ඒ සඳහා සානුබල සපයමින් ඒවායේ ක්‍රියාකාරීත්වය පිළිබඳව සෘජු අධීක්ෂණයක් ලබාදෙන ලදී.

	සංගමයේ නම	ලියාපදිංචි අංකය	ලියාපදිංචි දිනය
01	සී/ස ශ්‍රී ලංකා පොල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සංගමය	සී 1086	1942.04.01
02	සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය	සී 2490	1972.0726
03	සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය	සී 2504	1973.03.01
04	සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය	සී 2527	1974.03.19

05	සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම් හා ණය ගණුදෙනු සමුපකාර සමිති මහා සංගමය	සි 2651	1980.11.10
06	සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය	සි 2559	1981.09.02
07	සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය	සි 2689	1986.01.01
08	සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය	සමු 01	1989.09.15
09	සී/ස ශ්‍රී ලංකා ග්‍රාමීය බැංකු මහා සංගමය	සමු 17	1997.12.15
10	සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදන සමුපකාර සංගමය	සමු 29	2003.10.07
11	සී/ස සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ මහා සංගමය	සමු 30	2005.11.21
12	සී/ස ශ්‍රී ලංකා සහල් නිෂ්පාදකයන්ගේ සමුපකාර සංගමය	සමු 60	2018.08.08
13	සී/ස ශ්‍රී ලංකා ජාතික ජනෝදාන සංවර්ධන සමුපකාර මහා සංගමය	සමු 73	2019.04.04

දීප ව්‍යාප්ත මූල්‍ය සේවා සමුපකාර සමිති

බහුතරයක් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවකයින් සාමාජිකත්වය දරන සකසුරුවම්කම හා ණය ගණුදෙනු පිළිබඳ සමුපකාර සමිති වේ.

මෙම සමුපකාර සමිතිවල මූලික කාර්යයන්

1. සාමාජික ඉතුරුම් රාශීකරණය
2. සාමාජිකත්වයට ණය පහසුකම් සැපයීම
3. සාමාජික සුභසාධන කටයුතු (මරණාධාර, ශිෂ්‍යත්වාධාර, වෛද්‍යාධාර, පාරිභෝගික සේවා සැපයීම)
4. ව්‍යාපාරික කටයුතු (විශ්‍රාම ශාලා, නිවාඩු නිකේතන, උකස් සේවා, මුද්‍රණාල සේවා, රක්ෂණ නියෝජිත සේවා)

දීප ව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති

මෙම දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි ශ්‍රී ලංකාවම බල ප්‍රදේශය කර ගත් සාමාජිකයින්ගේ අවශ්‍යතා හා වුවමනා සපුරාලීම සඳහා භාණ්ඩ නිෂ්පාදන කාර්යයේ නියුතු සමුපකාර සමිති හා විවිධ සේවාවන් සැපයීමේ කාර්යයේ නියුතු සමුපකාර සමිති, දීපව්‍යාප්ත නිෂ්පාදන හා සේවා සමුපකාර සමිති ලෙස වර්ගීකරණය කර ඇත.

මෙම සමිතිවල මූලික කාර්යයන්

1. සාමාජිකයින්ගේ නිෂ්පාදන මිල දී ගැනීම.
2. නිෂ්පාදන හා සේවා සැපයීම සඳහා සාමාජිකයින්ට අවශ්‍ය අමුද්‍රව්‍ය ලබා දීම.
3. සාමාජිකයින්ගේ නිෂ්පාදන සඳහා වෙළඳපොල හඳුන්වාදීම සහ වෙළඳපොල අවස්ථා පුළුල් කිරීම.
4. සාමාජිකයින් සඳහා තාක්ෂණික මෙවලම් හා නවීන තාක්ෂණය හඳුන්වාදීම.

ලියාපදිංචි සහ ක්‍රියාකාරී සමිති/ සංගම් ව්‍යාපාරික කටයුතු අනුව වර්ග කිරීම

මූල්‍ය සේවා සමුපකාර සමිති/ සංගම්	
01	සී/ස ශ්‍රී ලංකාවේ සකසුරුවම්කම හා ණය ගණුදෙනු සමුපකාර සමිති මහා සංගමය
02	සී/ස ශ්‍රී ලංකා ජාතික තරුණ සේවා සමුපකාර සමිති සංගමය
03	සී/ස සමුපකාර ග්‍රාමීය බැංකු සංගමය
04	සී/ස සකසුරුවම් හා ණය ගණුදෙනු සමිති සම්පත් කළමනාකරණ සමුපකාර මහා සංගමය

05	සී/ස ශ්‍රී ලංකා ජාතික ජනෝද්‍යාන සංවර්ධන සමුපකාර මහා සංගමය
06	සී/ස රාජ්‍ය සේවා සමුපකාර ණයදීමේ හා ඉතිරි කිරීමේ සමිතිය
07	සී/ස බන්ධනාගාර දෙපාර්මේන්තුවේ අන්‌න්‍යෝ‍‍‍

06	සී/ස ශ්‍රී ලංකා සමුපකාර කර්මාන්ත මහා සංගමය
07	සී/ස ශ්‍රී ලංකා සමුපකාර පේෂ කර්මාන්ත සංගමය
08	සී/ස ශ්‍රී ලංකා තේ නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති මහා සංගමය
09	සී/ස සහල් නිශ්පාදකයින්ගේ සමුපකාර සංගමය
කෘෂිකාර්මික සමුපකාර සමිති/ සංගම්	
01	සී/ස සමස්ථ ලංකා විචිත්‍ර පැළෑටි සහ උඩවැඩියා සමුපකාර සමිතිය
02	සී/ස සමස්ත ලංකා කෘෂිකාර්මික සමුපකාර සමිතිය
03	සී/ස කෘෂිකාර්මික හා පාරිසරික විද්වතුන්ගේ සමුපකාර සමිතිය
04	සී/ස හරිත ප්‍රජා ව්‍යවසායකයින්ගේ ජාතික සමුපකාර
05	සී/ස ශ්‍රී ලංකාවේ හරිත සමුපකාර සමිතිය
06	සී/ස හදබිම සමුපකාර සමිතිය

කෘෂිකාර්මික සමුපකාර සමිති/ සංගම්	
01	සී/ස සමස්ථ ලංකා විචිත්‍ර පැළෑටි සහ උඩවැඩියා සමුපකාර සමිතිය
02	සී/ස සමස්ත ලංකා කෘෂිකාර්මික සමුපකාර සමිතිය
03	සී/ස කෘෂිකාර්මික හා පාරිසරික විද්වතුන්ගේ සමුපකාර සමිතිය
04	සී/ස හරිත ප්‍රජා ව්‍යවසායකයින්ගේ ජාතික සමුපකාර
05	සී/ස ශ්‍රී ලංකාවේ හරිත සමුපකාර සමිතිය
06	සී/ස හදබිම සමුපකාර සමිතිය

වෙනත් විවිධ සේවාවන් සැපයන සමුපකාර සමිති/ සංගම්	
01	සී/ස ශ්‍රී ලංකා ජාතික සමුපකාර මණ්ඩලය
02	සී/ස ශ්‍රී ලංකා වරාය නැව් සේවා සමුපකාර සමිතිය
03	සී/ස නිවාස හා දේපළ සංවර්ධන සමුපකාර සමිතිය
04	සී/ස ශ්‍රී ලංකාවේ තාක්ෂණ සංවර්ධන ජාතික සමුපකාර සමිතිය
05	සී/ස ව්‍යාපාර කළමනාකරණ ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන සහ තාක්ෂණික සේවා උපදේශන සමුපකාර සමිතිය
06	සී/ස ජනමාධ්‍යවේදීන්ගේ සමුපකාර සමිතිය
07	සී/ස සමස්ත ලංකා විදේශ භාෂා අධ්‍යාපන සංවර්ධන සමුපකාර සමිතිය
08	සී/ස තාරුණ්‍ය සවිබලගැන්වීමේ සමුපකාර සමිතිය
09	සී/ස ශ්‍රී ලංකා ජාතික ධීවර සමුපකාර සමිති සංගමය
10	සී/ස සමස්ත ලංකා මාදැල් හිමියන්ගේ ධීවර සමුපකාර සමිතිය
11	සී/ස ශ්‍රී ලංකා සමුපකාර අලෙවි සංගමය
12	සී/ස පුහුණු වෘත්තීයවේදීන්ගේ සමුපකාර සමිතිය
13	සී/ස විගණන හා කළමනාකරණ සේවා සැපයීමේ සමුපකාර සමිතිය
14	සී/ස ආරෝග්‍යශාලා සේවා සමුපකාර සමිති සංගමය
15	සී/ස තාක්ෂණික ව්‍යවසාය හා කළමනාකරණ සමුපකාර සංවර්ධන බැංකු සමිතිය
16	සී/ස ශ්‍රී ලංකා පාරිභෝගික සමුපකාර සමිති සංගමය
17	සී/ස ජාතික පරිසරය සුරකින්නන්ගේ සමුපකාර සමිතිය

විගණන අංශය

මෙම දෙපාර්තමේන්තුවේ විගණන අංශය විසින් ව්‍යවස්ථාපිත විගණන කටයුතු යටතේ 2015 සිට 2020 දක්වා සැලසුම් කරන ලද හා කාර්යාලය වෙත ලද විගණන වාර්තා පිළිබඳ තොරතුරු පහත සඳහන් පරිදි වේ.

විගණන් වර්ෂය	සැලසුම් කළ විගණන	නිම කළ විගණන	වර්ෂය තුල නිම කල විගණනයන්හි ප්‍රතිශතය
2015	80	11	13.75%
2016	102	37	36.27%
2017	58	43	74.13%
2018	108	56	60.48%
2019	47	31	65.95%
2020	105	46	43.81%

වසර 6ක සැලසුම් කළ විගණන හා නිම කළ විගණන



නීති අංශය

නීති කටයුතු වලට අදාළ ප්‍රධාන කාර්යයන් පහත පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකි ය.

1. සමුපකාර සමිතිවලට සම්බන්ධ නිතිරීති හා ව්‍යවස්ථා සම්බන්ධයෙන් අර්ථකතනයන් ඉදිරිපත් කිරීම හා පළාත් කොමසාරිස්වරුන් ඉදිරිපත් කරන නෛතික ගැටළු පිළිබඳ අවශ්‍ය සහය ලබාදීම
2. ආදර්ශ අතුරු ව්‍යවස්ථා සකස් කිරීම හා සකස් කරන ලද අතුරු ව්‍යවස්ථා අධ්‍යයනය කිරීම
3. සමුපකාර පනතේ 58 වගන්තිය යටතේ සමුපකාර සමිති/ සංගම් වලින් ඉදිරිපත් කරන තීරක ආරවුල් විභාග කිරීම, ප්‍රදානයන් ලබාදීම,අභියාචනා විභාග කිරීම හා උසාවි බල ගැන්වීම
4. සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන්, වග උත්තරකරුවන් කරමින් දිස්ත්‍රික් උසාවි, අභියාචනාධිකරණ සහ ශ්‍රේෂ්ඨාධිකරණ වලින් ඉදිරිපත් කරන නඩු සම්බන්ධයෙන් නීතිපති දෙපාර්තමේන්තුවේ සහාය ලබාගෙන අවශ්‍ය කටයුතු කිරීම

ආරවුල් බේරුම්කරණය

විස්තරය	**එකතුව**
2020/01/01 දිනට බේරුම්කරුවන් වෙත යොමු කිරීමට පවතින ගොනු සංඛ්‍යාව	38
2020 වර්ෂයේ බේරුම්කරණය සඳහා කාලය තුල ලද ගොනු සංඛ්‍යාව	34
එකතුව - යොමු කිරීමට	**72**
2020 වර්ෂයේ බේරුම්කරණය සඳහා යොමු කිරීම (බේරුම්කරුවන් වෙත ලබා දීම)	39
2020 වර්ෂය තුල ආපසු යැවූ ගොනු සංඛ්‍යාව	7
2020-12-31 දිනට බේරුම්කරණය සඳහා යොමු කිරීමට ඇති සංඛ්‍යාව	26

උසාවි දඩ මුදල් ප්‍රේෂණය

1. බේරුම්කරණ තීන්දු උසාවි බල ගැන්වීම් - 22
2. අධිකරණයෙන් දෙපාර්තමේන්තුව වෙත මුදල් ලබා ගැනීම් - රු.මි. 5.9
3. අධිකරණයෙන් ලද මුදල සමිතිය වෙත මුදා හැරීම් - රු.මි. 4.1

අතුරු ව්‍යවස්ථා සංශෝධන සඳහා නිර්දේශ ලබා දීම - 03

1. සී/ස රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ ස.ණ.ස සමිතිය
2. සී/ස තැපැල් හා ටෙලිකොම් සේවක සමුපකාර බැංකු සමිතිය
3. සී/ස ශ්‍රී ලංකා සමුපකාර ග්‍රාමීය බැංකු මහා සංගමය

නීති අංශය මඟින් සිදු කරන ලද අනෙකුත් විශේෂිත කාර්යන්

- ජාතික සමුපකාර ප්‍රතිපත්තිය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගැනීම
- සමුපකාර අතුරු ව්‍යවස්ථා සංශෝධනය සඳහා නිර්දේශ ලබා ගැනීම
- සමුපකාර සමිතිවල අතුරු ව්‍යවස්ථා සංශෝධනය සඳහා නිර්දේශ ලබා ගැනීම
- සමුපකාර සමිති සඳහා අවශ්‍ය නෛතික උපදෙස් ලබා දීම

අරමුදල් අංශය

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 43(1) (ආ) වගන්තිය සහ 57(3) වගන්තිය යටතේ පිහිටුවන ලද පහත සඳහන් අරමුදල් මෙම වර්ෂය තුළදී ද සමුපකාර සංවර්ධන කොමසාරිස්වරයා භාරයේ පැවති අතර , එම අරමුදලේ දායක මුදල් අය කර ගැනීම මෙන්ම වියදම් දැරීම, ආයෝජන, ණය හා ආධාර සැපයීම යන කාර්යයන් ගරු අමාත්‍යතුමාගේ අධීක්ෂණය හා විධානයට යටත්ව අමාත්‍යාංශ ලේකම්වරයාගේ සභාපතීත්වයෙන් යුත් අරමුදල් කමිටුවේ තීරණ අනුව කළමනාකරණය කරනු ලැබේ.

1. සමුපකාර සංවර්ධන අරමුදල
2. සමුපකාර අතිරික්ත අරමුදල

සමුපකාර සංවර්ධන අරමුදල

සමුපකාර සමිති ආඥා පනතේ (107 වැනි අධිකාරිය) 46 වගන්තිය යටතේ පනවා ඇති අංක 10086 සහ 1950.03.24 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියෝග මාලාව යටතේ පිහිටුවා ඇති මෙම අරමුදලට දායකත්වය දෙනු ලබන්නේ දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී ඇති සමුපකාර සංගම් හා දීප ව්‍යාප්ත සමුපකාර සමිති විසිනි.

සමුපකාර අතිරික්ත අරමුදල

1972 අංක 05 දරන සමුපකාර සමිති පනතේ 57(3) වගන්තියේ සඳහන් විධිවිධාන ප්‍රකාරව මෙම අරමුදල සංස්ථාපනය වී ඇති අතර අංක 93/5 දරන 1974 ජනවාරි 10 දිනැති විශේෂ ගැසට් පත්‍රයේ 44(i) සිට 44(iii) දක්වා සඳහන්ව ඇති ලියාපදිංචි සමිතියක් ඈවර කිරීම අවසන් කරනු ලැබූ හා එකී සමිතියේ යම් ණයහිමියෙක් විසින් වත්කම් බෙදාදීමේ යෝජනා ක්‍රමය යටතේ තමාට අය විය යුතු දේ සම්බන්ධයෙන් හිමිකම් කියාපෑම ඉදිරිපත් කරනු නොලැබ ඉතිරිවන අතිරික්තයක් යෙදවීමෙන් මෙකී සමුපකාර අතිරික්ත අරමුදල මූල්‍යනය වේ.

බැංකු අංශය

2013 වර්ෂයේ මැයි මස ස්ථාපිත කරන ලද මෙම අංශය මඟින් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව (රේඛීය) යටතේ ලියාපදිංචි මූල්‍ය කටයුතුවල නිරත සමුපකාර සමිති/සංගම් නියාමනය ද පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු යටතේ ලියාපදිංචි මූල්‍ය කටයුතුවල නිරත සමුපකාර සමිති/සංගම් නියාමනය සඳහා පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු සමඟ සහයෝගීතාවයෙන් එම පළාත්වල මූල්‍ය කටයුතුවල නිරත සමුපකාර සමිති/සංගම් නියාමනයට අවශ්‍ය උපදෙස් හා මඟපෙන්වීම් ලබා දීම ද සිදු වේ.

අනු අංකය	ක්‍රියාකාරකම	මිණුම් ඒකකය	භෞතික ප්‍රගතිය	
			ඉලක්ක	ලඟාකර ගැනීම
01	සමුපකාර සමිතිවල මූල්‍ය අංශ සමාලෝචනය සඳහා සෑම කාර්තුවක් අවසානයේදී ම මූල්‍ය තත්ත්ව විශ්ලේෂණ වාර්තා ගෙන්වා ගැනීම.	වාර්තා සංඛ්‍යාව	36	27
02	කාර්තුවකට වරක් සෑම පළාතකින්ම ග්‍රාමීය බැංකු ත්‍රෛමාසික වාර්තා ලබා ගැනීම.	වාර්තා සංඛ්‍යාව	36	27
03	ස්ථානීය පරීක්ෂණ සිදු කිරීම	පරීක්ෂණ	24	02
04	සමුපකාර මූල්‍ය ආයතන නියාමනය සඳහා පනතක් සකස් කිරීම	පනත සකසා අමාත්‍යාංශය වෙත භාරදීම	පනත සකසා අමාත්‍යාංශය වෙත භාරදීම සිදුකර ඇත.	
05	චක්‍රලේඛ / නියාමන උපදෙස් නිකුත් කිරීම	චක්‍රලේඛ හා නියාමන උපදෙස් කෙටුම්පත් කිරීම හා අනුමැතිය ලබා ගැනීම .	චක්‍රලේඛ 05 හා නියාමන උපදෙස් 10ක් කෙටුම්පත් කිරීම සිදුකර ඇත.	
06	පුහුණු පාඨමාලාවන් 1 ක් පැවැත්වීම	පාඨමාලා පැවැත්වීම	01	-
07	නියාමන කමිටු රැස්වීම් 02ක් පැවැත්වීම		02	02
08	පළාත් සම්බන්ධීකරණ රැස්වීම් 02ක් පැවැත්වීම.		02	01
09	බැංකු නියාමන ජාතික ඒකකය සඳහා බඳවා ගැනීම හා සේවයේ යෙදවීම.		අර්ධකාලීන උපදේශකවරුන් 02 බඳවා ගැනීම හා සේවයේ යෙදවීම	අර්ධකාලීන උපදේශකවරුන් 02 බඳවා ගැනීම හා සේවයේ යෙදවීම සිදුකර ඇත

කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ දැනුම් දීම පරිදි පළාත් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ විගණන නිලධාරීන් හා සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තු විගණන නිලධාරීන් එක්ව 2021 වර්ෂය අවසන් වීමට ප්‍රථමව සියලුම ග්‍රාමීය බැංකු ශාඛා සඳහා කළමනාකරණ විගණනයක් සිදු කිරීම සඳහා විගණන ආකෘතියක් සැකසීම.

IFAD ආයතනයට සම්බන්ධිත කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) මඟින් සමුපකාර ග්‍රාමීය බැංකුව ශාඛා වෙත SAPP ණය මුදාහැරීමේ කටයුතු සංවිධානය කිරීම. ඒ අනුව 2020.11.23 දින සී/ස ග්‍රාමීය බැංකු මහා සංගමය සහ මහජන බැංකුව ණය ගිවිසුම් සඳහා අත්සන් තැබීම සිදු විය. මෙම ණය ක්‍රමය යටතේ ක්‍රියාත්මක ණය අතර, අගය දාමය ණය (4P Loans), ආදායම් උත්පාදන ණය (Income Generation Loan) තරුණ ණය (Youth Loans) වේ.

ග්‍රාමීය බැංකු හා මූල්‍ය සමුපකාර සමිති නියාමනය සඳහා වූ පුහුණු වැඩසටහනක් පැවැත්වීම.

ව්‍යාපෘති අංශය

මෙම අංශය මඟින් පහත සඳහන් ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සිදුකරන ලදී.

1. ලක්මල් උයන උඩවැඩියා උද්‍යානය සහ විසිතුරු ශාඛා සේවා පියස සංවර්ධන කිරීම. එම ව්‍යාපෘතිය සඳහා විසිතුරු ශාඛ හා අමුද්‍රව්‍ය, උපකරණ මිල දී ගැනීමට හා ඉඩම් මිනුම් කටයුතු කටයුතු සඳහා වැය වූ මුදල රු. 1,544,500.00 කි.
2. නැණ ශක්ති වැඩසටහන යටතේ පාසල්වල පෙළ පොත් වලට සමුපකාර පිළිබඳව විෂය කොටස් ඇතුලත් කිරීමට කමිටු 02ක් පැවැත්වීම. එම සමුළු පෙබරවාරි හා අගෝස්තු මස පැවැත් වූ අතර, ඒ සඳහා වැය වූ මුදල රු.122,015.00කි.
3. COVID – 19 පළමු අවස්ථාවේ දී ජාතික මට්ටමින් අත්‍යාවශ්‍ය භාණ්ඩ බෙදාහැරීමේ කඩිනම් වැඩ පිළිවෙළක් ආරම්භ කර ක්‍රියාත්මක කළ අතර, ඒ සඳහා රු. 248,020,108.00ක් වැය විය.
4. නියමු ව්‍යාපෘතියක් ලෙස ප්‍රාදේශික වෙළඳසැල් 30ක් ස්ථාපිත කිරීම සඳහා මූලික කටයුතු සිදු කිරීම. (පළාත් 09 ම ආවරණය වන පරිදි)
5. කෘෂි නිෂ්පාදන අගය වැඩිකිරීමේ ව්‍යාපෘතියක් හදඳුන්වා දීමට කටයුතු කිරීම. ඒ සඳහා උඟව පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව, උඟව පළාත් දේශගුණ අනුහුරු ව්‍යාපෘතිය, පශු අස්වනු තාක්ෂණ ආයතනය, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව හා තෝරාගත් සමිති කිහිපයක් එකතු වී රැස්වීම් 02ක් පවත්වා ඇත. මීළඟ රැස්වීම උඟව පළාත තුල පැවැත්වීමට යෝජනා කර ඇත.
6. ඒකාබද්ධ ගැණුම් ක්‍රමයක් ස්ථාපිත කිරීම සඳහා ජාතික සමුපකාර මණ්ඩලයේ මූලිකත්වයෙන් සැලසුම් සකස් කිරීම.
7. දීප ව්‍යාප්තව පවතින කෝප්සිටි වෙළඳසැලක් නවීකරණය සහ නව කෝප්සිටි පිහිටු වීම.
8. පළාත් මට්ටමින් කෝප්සිටි සංවර්ධනය කිරීම සඳහා වූ දැනුවත් කිරීමේ වැඩ සටහන් 4ක් පැවැත්වීම. (බස්නාහිර, මධ්‍යම, සබරගමුව, උතුරු මැද)
9. අමාත්‍යාංශය වෙත පැවරී ඇති කාර්ය භාරය සඳහා, අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වී සංයුක්ත සැලැස්ම සකස් කිරීම.
10. පළාත් කොමසාරිස් සමුළු 03 ක් පැවත්වීමට කටයුතු කිරීම.

අනු අංකය	ව්‍යාපෘතිය	ප්‍රගතිය
01	සමුපකාර සමිති හරහා වී ගොවීන්ගෙන් සහතික මිල යටතේ වී මිල දී ගැනීම හා වෙළෙඳපලට සහල් නිෂ්පාදනය යොමු කිරීම	වී මිල දී ගැනීම පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස්වරුන්ගේ දැඩි අධීක්ෂණය යටතේ විවිධ සේවා සමුපකාර සමිති සහ හිඟ ණය නොමැති දිස්ත්‍රික් සහල් නිෂ්පාදකයින්ගේ සමුපකාර සමිති මඟින් වී මිල දී ගැනීම සිදු කරන ලදී. 2020 යල කන්නයේ වී මිල දී ගැනීම සඳහා ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව මඟින් මුලධන අරමුදල් රු.මිලියන 300 ක් සුළු හා මධ්‍ය පරිමාණ සහල් නිපදවන්නන්ගේ සමුපකාර සමිති සඳහා වෙන් කරන ලදී. එකී ප්‍රතිපාදන වලින් රු.මි. 276.7ක් සමුපකාර සමිති වෙත ලබා දී වී මිල දී ගැනීම සිදු කරන ලදී.
02	නැණ ශක්ති	සමුපකාර ව්‍යාපාරය කෙරෙහි පාසැල් දරුවන්ගේ නැඹුරුව ප්‍රවර්ධනය කිරීම අරමුණු කරගෙන පාසැල් දරුදැරියන් සමුපකාර ක්ෂේත්‍රය පිළිබඳව පුළුල් දැනුවත්භාවයක් ඇති කිරීම සඳහා 6 – 11 දක්වා පාසල් පෙළ පොතට සමුපකාර විෂය පථය ඇතුළත් කිරීමට තීරණය විය. ඒ සඳහා පළමු කමිටු රැස්වීම 2020.02.10 දින පැවැත් වූ අතර, දෙවන කමිටු රැස්වීම 2020.07.31 පැවැත්විය. ඒ සඳහා වැය වූ මුදල රු. 122,015 කි.

03	ලක්මල් උයන උඩවැඩියා උද්‍යානය හා විසිතුරු ශාක සේවා පියස ව්‍යාපෘතිය	සී/ස සමස්ත ලංකා විචිත්‍ර පැලෑටි සහ උඩවැඩියා සමුපකාර සමිතියේ අක්කර 20කින් යුත් භූමිය උද්‍යානයක් ලෙස සකස් කිරීමත්, පටක රෝපණ විද්‍යාගාරයක් සකස් කිරීම හා මල් පැළ හා ශාක වර්ග සඳහා වෙළෙඳපලක් සකස් කිරීම, මූලික කරගෙන මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක වේ. මෙය වසර 03ක ව්‍යාපෘතියකි. ලක්මල් උයන උඩවැඩියා උද්‍යානය සහ විසිතුරු ශාක සේවා පියස සංවර්ධනය කිරීම, අක්කර 20කින් යුතු භූමියේ මිනුම් කටයුතු සිදු කිරීමට සහ නව ශාක වර්ග මිල දී ගැනීමට මෙම වසරේ දී රු.1,544,500ක් වැය විය.

කළමනාකරණ හා පර්යේෂණ අංශය

මෙම අංශය මඟින් සිදු කරන ලද කාර්යයන් පහත පරිදි සංක්ෂිප්ත කර දැක්විය හැකි ය.

1. පළාත් වෙතින් ඉදිරිපත් වූ ව්‍යාපෘති පිළිබඳ සාකච්ඡා කිරීම සඳහා රැස්වීම් සංවිධානය, තොරතුරු ලබා ගැනීම සහ නිර්දේශ ඉදිරිපත් කිරීම.
2. සමුපකාර ප්‍රවර්ධනයට අදාලව කල යුතු පර්යේෂණයන් සඳහා විවිධ ක්ෂේත්‍රයන් හඳුනා ගැනීම පිළිබඳ ජාතික සමුපකාර සංවර්ධන ආයතනය වෙත සංකල්ප පත්‍රිකාවක් ඉදිරිපත් කිරීම.

අනු අංකය	ව්‍යාපෘතිය	ප්‍රගතිය
01	පාසල් ළමුන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීමේ ව්‍යාපෘතිය	කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් පාසැල් සිසුන් සඳහා පෝෂණ මල්ලක් ලබාදීමේ වැඩසටහන අධ්‍යාපන අමාත්‍යාංශය සහ මෙම දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණය වෙමින් සී/ස ශ්‍රී ලංකා අලෙවි සංගමය හරහා සිදු කරන ලදී. මෙම වැඩසටහන අදියර 03ක් යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබුණි. නමුත් වසරේ දී එම ව්‍යාපෘතියේ පළමු අදියර සාර්ථකව නිම කරන ලද අතර, පාසැල් දරුවන් සඳහා රු.157,888.00 ක වටිනාකමින් යුතු පාසැල් උපකරණ කට්ටල 3167 ක් බෙදා හරින ලදී. දෙවන අදියරේ බස්නාහිර සහ දකුණු පළාත්වල පෝෂණ මළු බෙදා හැරීම සිදු කරන ලදී.

වෙනත් විශේෂ කරුණු

- සමිති හා සංගම් වෙතින් වාර්තා වන නව නිපැයුම් (නවෝත්පාදන), ආයෝජන අවස්ථා පිළිබඳ තොරතුරු ගෙන්වාගෙන ඇතුලත් කිරීම.
- වාර්ෂිකවකරනු ලබන කාර්ය සාධන ඇගයීම තුලින් විෂිශ්ඨතා ලබාගත් සමිති හා සංගම් ඇතුලත් කිරීම.

තොරතුරු තාක්ෂණ අංශය

- සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව සඳහා වෙබ් පාදක කළමනාකරණ තොරතුරු මෘදුකාංග පද්ධතියක් සැදීමේ ව්‍යාපෘතිය (Info Coop Management Information Software System) සැදීම තනි ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීම සංකීර්ණ නිසා ව්‍යාපෘතිය කොටස් වලට බෙදා Point of Sale System හා Banking System ලෙස ක්‍රියාත්මක කිරීමට තීරණය කරන ලදී.
- Point of Sale System ක්‍රියාත්මක කිරීම. එහි දී,
  තාක්ෂණික ඇගයීම් කමිටුව පත් කරගැනීම,
  Request for Proposal දැන්වීම සහ ලේඛණය සකස් කිරීම සහ අනුමැතිය ලබා ගැනීම,
  අමාත්‍යාංශ උපදේශක ප්‍රසම්පාදන කමිටුව පත් කරගැනීම,
  Request for Proposal දැන්වීම සහ ලේඛණය සාදා අවසන් කිරීම,
  Request for Proposal දැන්වීම පල කිරීම,
  Request for Proposal ලේඛණය නිකුත් කිරීම,
- සමුපකාර ක්ෂේත්‍රය සඳහා බැංකු පද්ධතියක් ක්‍රියාත්මක කිරීම ව්‍යාපෘතිය (Banking System) ක්‍රියාත්මක කිරීම සඳහා දැනට සාර්ථකව පවතින මෘදුකාංග අධ්‍යයනය කිරීම සහ අවශ්‍යතා විශ්ලේෂණය කිරීම.
- නෛතික සිද්ධි කළමනාකරණ මෘදුකාංග පද්ධතිය (Legal Case Software) සැකසීම.
- අයිතම මිල කළමනාකරණ මෘදුකාංගය සෑදීම. (Item Price Management Software System)
- Best Coop පද්ධතිය ඒකාබද්ධ කිරීම. (Best Coop software integration)
- කෝප් සිටි පිළිබඳව වර්තමාන මෘදුකාංග සැපයුම්කරුවන් සමඟ සාකච්ඡා කිරීම.
- දෙපාර්තමේන්තුව සඳහා නවීකරණය කරන ලද නිල වෙබ් අඩවියක් නිර්මාණය කිරීම.
- දෙපාර්තමේන්තු නිල වෙබ් අඩවිය (Official Website) කළමනාකරණය කිරීම.
  2020 වර්ෂයේ දී අංශ වලින් ලැබෙන ලේඛණ වෙබ් අඩවියට ඇතුළත් කිරීම/ වෙබ් අඩවි අන්තර්ගත යාවත්කාලීන කිරීම
  (Content, News, Banners, Image & Files)
- Web server නඩත්තු කිරීම.
- දත්ත රැස් කිරීම.
- දෙපාර්තමේන්තුව සඳහා අවශ්‍ය Designing work (Art works) සිදුකිරීම.
- නිලධාරීන් සඳහා Official Email කළමනාකරණය කිරීම, නිලධාරීන් සඳහා Official Email නිර්මාණයට අවශ්‍ය කටයුතු කිරීම.
- LGN අන්තර්ජාල පහසුකම නිලධාරීන්ට ලබාදීමේ කටයුතු කළමනාකරණය කිරීම.
- දෙපාර්තමේන්තු Official Facebook නඩත්තු කිරීම හා අන්තර්ගතය යාවත්කාලීන කිරීම.
- Desktop පරිගණක හා Laptop පරිගණක නඩත්තුව සඳහා අවශ්‍ය තාක්ෂණික කටයුතු සම්බන්ධීකරණය කිරීම.
- දෙපාර්තමේන්තුව සඳහා තොරතුරු තාක්ෂණ සහාය ලබා දීම.

03 පරිච්ඡේදය - 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාලසීමාව සඳහා වන මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසිඒ-ඒෆ්

අයවැය 2020		සටහන	තක්‍ය 2020	2019	
-	**ආදායම් ලැබීම්**		-	-	
-	ආදායම් බදු	**1**	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	**2**		-	ඒසිඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	**3**	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	**4**	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		81,099,330	208,725,150	ඒසිඒ-3
-	තැන්පතු		144,877	138,476	ඒසිඒ-4
-	අත්තිකාරම් ගිණුම්		5,724,517	5,001,831	ඒසිඒ-5/5(ඒ)/5 (බී)
-	වෙනත් ලැබීම්		3,807,540	6,224,141	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**90,776,264**	**220,089,598**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**90,776,264**	**220,089,598**	
	අඩුකළා : වියදම්				
81,250,000	**පුනරාවර්තන වියදම්**		-	-	
64,135,750	වැටුප්, චේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	**5**	62,474,947	57,965,327	
15,660,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	**6**	14,728,253	16,575,416	ඒසිඒ-2(ii)
1,400,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	**7**	1,315,324	1,117,076	
-	පොළී ගෙවීම්	**8**	-	-	
54,250	වෙනත් පුනරාවර්තන වියදම්	**9**	54,250	-	
81,250,000	**මුළු පුනරාවර්තන වියදම් (ඈ)**		**78,572,774**	**75,657,819**	
6,310,000	**මූලධන වියදම්**				
510,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	**10**	383,353	828,655	
200,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	**11**	199,910	1,014,769	
5,200,000	ප්‍රාග්ධන මාරුකිරීම්	**12**	5,115,833	21,070,921	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	**13**	-	-	
400,000	හැකියා වර්ධනය	**14**	190,569	397,035	
-	වෙනත් මූලධන වියදම්	**15**	-	-	
6,310,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**5,889,665**	**23,311,380**	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**3,892,560**	**5,724,902**	
	තැන්පතු ගෙවීම්		**124,250**	**134,620**	ඒසිඒ-4
	අත්තිකාරම් ගෙවීම්		**3,768,310**	**5,590,282**	ඒසිඒ-5/5(ඒ)/5(බී)
	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		**88,354,999**	**104,694,101**	
-	**2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)**		**2,421,265**	**115,395,497**	

3.2 මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2020 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	කක්‍ෂ්‍ය 2020 රු.	2019 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ පිරියත හා උපකරණ	ඒසිඒ-6	54,529,709.00	54,329,799.00
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	14,191,364.00	16,147,573.00
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	600.00	-
මුළු වත්කම්		**68,721,673.00**	**70,477,372.00**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		11,329,900.00	13,182,668.00
දේපළ පිරියත හා උපකරණ සංචිතය		54,529,709.00	54,329,799.00
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5 (බී)		
ජංගම වගකීම්			
නැන්පතු ගිණුම්	ඒසිඒ-4	2,861,464.00	2,907,500.00
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	600.00	57,405.00
මුළු වගකීම්		**68,721,673.00**	**70,477,372.00**

පිටු අංක...01.....සිට ...43..... දක්වා ඒසිඒ 1 සිට ඒසිඒ6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 44 . සිට 51. දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ.මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්ම වලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මඟින් හෙලිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත.ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා,ර්ට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....	.....	.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
නම : කේ.ඩී.එස්. රුවන්වන්ද්‍ර	නම :සුවින්ද එස්. සිංගප්පුලි	අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
තනතුර -ලේකම්,සමුපකාර සේවා,අලෙවි සංවර්ධන හා පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය	තනතුර :සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්	නම -ටී.එම්.ටී.එච්.සරත්චන්ද්‍ර
දිනය : 2021.02.24	දිනය : 2021/02/24	දිනය : 2021/02/24

කේ.ඩී.එස්. රුවන්වන්ද්‍ර
ලේකම්
සමුපකාර සේවා, අලෙවි සංවර්ධන සහ
පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශය
08 වන මහල, එච්.කියු.කලම්බු ගොඩනැගිල්ල,
අංක. 464 ඒ, ටී.බී. ජයා මාවත, කොළඹ 10.

සුවින්ද එස්. සිංගප්පුලි
සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ
සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්
බැ.පෙ. 419, අංක: 330, යුනියන් පෙදෙස,
කොළඹ 02.

ටී. එම්. ටී. එච්. සරත්චන්ද්‍ර
ගණකාධිකාරි
සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව
බැ.පෙ. 419, අංක. 330, යුනියන් පෙදෙස,
කොළඹ 02.

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	එස්ඒ-සී	
	ප්‍රත්‍ය	
	2020	**2019**
	රු.	රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	644,660	3,949,287
වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මඟින් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	81,099,330	208,725,150
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**81,743,990**	**212,674,437**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	71,948,762	71,017,006
සහනාධාර සහ මාරුකිරීම්	1,315,324	23,311,380
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	461,028	115,142,640
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	58,005	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**73,783,119**	**209,471,026**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**7,960,871**	**3,203,411**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	97,230	-
උපණය අයකර ගැනීම්	-	-
අත්තිකාරම් අයකර ගැනීම්	61,993	1,194,078
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**159,223**	**1,194,078**
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	5,889,665	-
අත්තිකාරම් ගැනීම්	2,230,680	4,310,790
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**8,120,345**	**4,310,790**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(7,961,122)**	**(3,116,712)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	**(251)**	**86,699**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	112,427	105,326
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**112,427**	**105,326**
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-

තැන්පත්ගෙවීම්	112,176	134,620
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**112,176**	**134,620**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	**251**	**(29,294)**
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ)	**-**	**115,993**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	**57,405**	**-**
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**-**	**57,405**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

1. වාර්තාකරණ කාලපරිච්ඡේදය

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. මිණුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. ආදායම් හඳුනාගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. මුදල් හා මුදල් සමාන දෑ

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

රු.

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
-	-	-	-	-	-

3.6 වෙන්කරන ලද ප්‍රතිපාදන උපයෝගී කරගැනීමේ කාර්යසාධනය

රු.

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදනවල % ලෙස
	මුල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	81,250,000	81,250,000	78,572,774	96.7
මූලධන	87,560,000	87,560,000	84,370,339	96.3

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/ පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
-	-	-	-	-	-	-

3.8 මූල්‍ය නොවන වෙනත් වත්කම් වාර්තාකිරීමේ කාර්ය සාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	-	-	-	-
9152	යන්ත්‍රෝපකරණ		54,529,709		
9153	ඉඩම්	-	-	-	-
9154	අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-
9155	ජීව විද්‍යාත්මක වත්කම්	-	-	-	-
9160	කෙරීගෙන යන වැඩ	-	-	-	-
9180	බදු දෙන ලද වත්කම්	-	-	-	-

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

(13)

මගේ අංකය எனது இல. My No. } TCM/D/CODD/FA/2020 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2021 අගෝස්තු 13 දින.



සමූපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්,

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව.

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූල සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි

හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන් මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

1.6.1.1 පුනරාවර්තන වියදම්

වැය විෂයය අංක 301-1-1-1-1701 යටතේ ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයක් නොතිබුණු අතර මුදල් රෙගුලාසි 66/69 ප්‍රතිපාදන මඟින් ප්‍රතිපාදන මාරු කර ගැනීමෙන් රු.54,250 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණු අතර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ එය වියදමක් ලෙස දක්වා තිබීම හේතුවෙන් මුළු පුනරාවර්තන වියදම් රු.78,572,774 ක් ලෙස රු.54,250 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.2 අක් මුදල් ගැලැපුම් ගිණුම

2020 දෙසැම්බර් 31 දිනට මූල්‍යකාර්ය සාධන ප්‍රකාශය අනුව අග්‍රිම ශේෂය රු.54,250 ක් අඩුවෙන් දක්වා තිබුණි.

1.6.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

1.6.3.1 මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ආදායම් නොවන ලැබීම් වල එකතුව රු.3,763,596 ක් වූ අතර එයින් වත්කම් විකිණීමෙන් ලද රු.97,230 ක් මුදල අඩුකර රු.3,666,366 ක වටිනාකම ආදායම් නොවන ලැබීම් ලෙස දැක්විය යුතු වුවද, මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.644,660 ක් ලෙස දැක්වීම හේතුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු.3,021,706 කින් අඩුවෙන් ගිණුම්වල දක්වා තිබුණි.

(ආ) මුදල් වැය කිරීම්

i. පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් වල එකතුව ගණනය කිරීමේදී මුළු වියදමින් සහනාධාර සහ මාරුකිරීම් වියදම් හා මූලධන වත්කම් අත්පත් කර ගැනීමේ වියදම් අඩු කිරීමෙන් පසු වටිනාකම වන රු.82,802,104 ක් දැක්විය යුතු වුවද එය රු.71,948,762 ක් ලෙස රු.10,853,342 ක් අඩුවෙන් දක්වා තිබුණි.

ii. භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිමය රු.600 ක් වූ අතර මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.58,005 ක් ලෙස රු.57,405 ක් වැඩියෙන් දක්වා තිබුණි.

1.6.3.2 ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂය තුල අත්කිකාරම් මුදලින් අයකර ගැනීම් රු.2,112,768 ක් වුවද එය ආයෝජන ක්‍රියාකාරකම් වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය ගණනය කිරීමේදී රු.61,993 ක් ලෙස මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ගෙන තිබුණි.

(ආ) භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් වටිනාකම රු.199,910 ක් වුවද මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ එය රු.5,889,665 ක් මුළු මූලධන වියදම ලෙස දක්වා තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

වර්ෂය තුළ සැලැසුම් කළ පරිදි අග්‍රිමය රු.123,324,990 ක් වූ අතර ලද අග්‍රිමය රු.81,099,330 ක් වූයෙන් සැලසුම් කල පරිදි ප්‍රතිපාදනය උපයෝජනය කිරීමට නොහැකි වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 301-1-1-1003 වෙනත් දීමනා වැය විෂයය අංකය සඳහා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය රු.16,500,000 ක් වූ අතර මු.රෙ.66/69 ප්‍රතිපාදන මඟින් රු.1,564,250 ක් වෙනත් වැය විෂයයන් වෙත මාරුකර තිබුණි.

(ආ) 301-1-1-1505 වැය විෂයය අංකය සඳහා ශුද්ධ ප්‍රතිපාදනය රු.550,000 ක් වූ අතර වියදම රු.479,683 ක් වූයෙන් රු.70,317 ක ඉතිරියක් පැවතිය ද ඒ සඳහා හේතු ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) වැය විෂය අංක 1409 සඳහා ප්‍රතිපාදන ඉතිරිවීමට හේතුව ලෙස කොවිඩ් 19 හේතුවෙන් නිලධාරීන්ගේ අඛණ්ඩ සේවය නොලැබීම බව ගිණුමේ දක්වා තිබුණු නමුත් වාර්ෂික ඇස්තමේන්තු මඟින් වෙන්කල ප්‍රතිපාදනය මු.රෙ.66/69 ප්‍රතිපාදන මාරුකිරීම් මඟින් සියයට 50 කින් වැඩිකර ගැනීම නිසා ප්‍රතිපාදන ඉතිරිවීමට හේතු වී තිබුණි.

2.3 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මු.රෙ.94(1) ප්‍රකාරව ප්‍රතිපාදන ඉක්මවා බැරකම් වලට නොබැඳිය යුතු වුවද වැය විෂය අංක 301-1-1-1301 සඳහා ප්‍රතිපාදනය රු.2,410,000 ක් වූ අතර වියදම රු.2,409,971 ක් විය. ඉතිරිය ඉක්මවා රු.486,862 ක බැරකම් වලට එළඹ තිබුණි.

(ආ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2020 හි 10.1 ඡේදය යටතේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාල මාර්ගෝපදේශ අංක 06 හි 3.4 ඡේදයට අනුව වාර්තා නොකල බැරකමක් පෙර වර්ෂයේ වියදමක් ලෙස ගෙවිය නොහැකි වුවත් මූල්‍ය ප්‍රකාශනයේ වැය විෂයයන් 04 ක් සම්බන්ධයෙන් දක්වා තිබුණු බැරකම් ප්‍රමාණයට වඩා රු.73,970 ක් වැඩියෙන් බැරකම් වලට බැඳී තිබුණි.

(ඇ) වැය විෂයයක් සඳහා වූ රු.11,388 ක බැරකම් 2021 වර්ෂයේ ගෙවීම් අනුව සනාථ කර ගත නොහැකි විය.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

එක් ජංගම ගිණුමට අදාලව මාස 06 ඉක්ම වූ රු.91,093 ක් වටිනා චෙක්පත් 05 ක් සම්බන්ධයෙන් මු.රෙ.396 (ඇ) පරිදි කටයුතු කර නොතිබුණි.

2.5 තැන්පතු

2015 ජූනි 24 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 243/2015 පරිදි පොදු තැන්පත් ගිණුම් එක් එක් කාර්යයට අදාලව වෙන වෙනම පවත්වාගෙන යා යුතු වුවත්, දෙපාර්තමේන්තුවේ මුද්දර ගාස්තු, ටෙන්ඩර් තැන්පතු ආදිය තෙවන පාර්ශ්වයන් වෙත නැවත ගෙවීම් කිරීම වෙනුවෙන් තාවකාලිකව රඳවාගන්නා තැන්පතු ගිණුමේ ඇතුලත් කර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීමේදී වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම හා අභ්‍යන්තර විගණන සැලැස්ම අන්තර්ගත විය යුතු වුවද, දෙපාර්තමේන්තුව විසින් සකස් කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මෙහි මෙම කරුණු අන්තර්ගත කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

2020 වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

4. තිරසාර සංවර්ධනය

4.1 තිරසර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

2018 ජූලි 17 දිනැති අංක 4/2018 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් ඉටු කර ගත යුතු තිරසාර සංවර්ධන අරමුණු හඳුනාගෙන නොතිබුණි.

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි

5.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව විගණන හා කළමනාකරණ කමිටු පවත්වා නොතිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

අනුයුක්ත කාර්ය මණ්ඩලය, තත්‍ය කාර්ය මණ්ඩලය පහත දැක්වේ.

	අනුමත	තත්‍ය	පුරප්පාඩු
ජ්‍යෙෂ්ඨ	12	07	05
තෘතීයික	09	02	07
ද්විතික	110	87	23
ප්‍රාථමික	20	16	04
එකතුව	**151**	**112**	**39**

දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාව 151 ක් වූ අතර තත්‍ය සේවක සංඛ්‍යාව 112 ක් වූයෙන් 39 ක පුරප්පාඩු පැවතිණි.

ඒ. ඒ. ඩී. ධර්මසිරි
අතිරේක විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

04 පරිච්ඡේදය - කාර්යසාධන දර්ශක

4.1 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව 2020.12.31 දිනට ප්‍රගතිය

අනු අංකය	අංශය	කාර්ය සාධන දර්ශකය	2020.12.31 දිනට ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස
01	පාලන	08	63%
02	සමිති	15	83%
03	විගණන	08	90%
04	ඇවර	03	66%
05	බැංකු	13	75%
06	නීති හා ආරවුල් බේරුම්කරණය	10	50%
07	කළමණාකරණ පර්යේෂණ	03	Covid – 19 හේතුවෙන් පළාත් සම්බන්ධීකරණයෙන් කරනු ලබන වැඩසටහන් බැවින් පැවැත්වීමට නොහැකි විය.
08	තොරතුරු තාක්ෂණ	03	66%
09	පුහුණු	18	Covid – 19 හේතුවෙන් පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.
10	මාධ්‍ය	12	සමුපදීපනී පුවත්පත මුද්‍රණය කර ප්‍රකාශයට පත් කිරීම ජනවාරී සහ පෙබරවාරී යන මාසවල පමණක් සිදු විය.
11	සැලසුම් සහසංවර්ධන ප්‍රගති පාලන	10	40% Covid – 19 හේතුවෙන් සැලසුම් කරනු ලැබූ වැඩසටහන් සැලකියයුතු ප්‍රමාණයක් පැවැත්වීමට නොහැකි විය.
12	ව්‍යාපෘති	12	4% Covid – 19 හේතුවෙන් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න.

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
-	-	-	-	-	-

Covid – 19 හේතුවෙන් 2020 වර්ෂය සඳහා තිරසාර සංවර්ධන අරමුණු (SDG) ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

06 පරිච්ඡේදය

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	තනතුර	අනුමත තනතුරු සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්	01	01	00
	නියෝජ්‍ය කොමසාරිස්/ සහකාර කොමසාරිස් (ශ්‍රී ලංකා පරිපාලන සේවය II, III)	04	01*	04
	ගණකාධිකාරී (ශ්‍රී ලංකා ගණකාධිකරණ සේවය III/ II)	01	01	00
	අභ්‍යන්තර විගණක (ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවය III/ II)	01	00	01
	නියෝජ්‍ය කොමසාරිස් /සහකාර කොමසාරිස් (දෙපාර්තමේන්තු ගත)	03	03	00
	නීති නිලධාරී (දෙපාර්තමේන්තු ගත)	01	01	00
	සහකාර අධ්‍යක්ෂ - තොරතුරු තාක්ෂණ (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය)	01	01	00
	එකතුව	**12**	**ස්ථිර - 07** **කොන්ත්‍රාත් - 01***	**05**
තෘතීය මට්ටම	පරිපාලන නිලධාරී	01	00	01
	සමුපකාර සංවර්ධන නිලධාරී (අධි ශ්‍රේණිය)	05	02**	03
	භාෂා පරිවර්තක	01	01***	00
	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය III, II)	02	00	02
	එකතුව	**09**	**03**	**06**
ද්විතීය මට්ටම	සමුපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර	37 } 62	20 } 48	14 ****
	සමුපකාර සංවර්ධන නිලධාරී	25 }	28 }	
	සංවර්ධන නිලධාරී	15	11	04
	තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණ සහකාර (ශ්‍රී ලංකා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය III, II)	05	04	01
	කළමනාකරණ සේවා නිලධාරී	28	17	11
	උපාධිධාරී අභ්‍යාසලාභී පුහුණු	00	07	-07
	එකතුව	**110**	**87**	**30**
ප්‍රාථමික මට්ටම	රියදුරු	05	05	00
	කාර්යාල කාර්ය සහයක	15	11	04
	එකතුව	**20**	**16**	**04**
මුළු එකතුව		**151**	**115**	**45**

*කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් විශ්‍රාමික ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරිනියක් එම රාජකාරී කටයුතු ඉටු කරනු ලබයි.

**සමුපකාර සංවර්ධන නිලධාරී අධි ශ්‍රේණිය පුරප්පාඩු 03න් පුරප්පාඩු 02ක් සඳහා සමුපකාර සංවර්ධන නිලධාරී I ශ්‍රේණියේ නිලධාරිනියන් දෙදෙනෙක් රාජකාරී ආවරණය කරනු ලබයි.

*** භාෂා පරිවර්තක තනතුරෙහි කොන්ත්‍රාත් පදනම මත බඳවාගත් නිලධාරියකු රාජකාරී ඉටු කරනු ලබයි.

**** ඉදිරියේදී පුරප්පාඩු වන සමූපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර තනතුරු පුරප්පාඩු සඳහා බඳවාගැනීම් සිදු නොකරන අතර, සමූපකාර ප්‍රවර්ධන හා විමර්ශන සහකාර නිලධාරීන් සහ සමූපකාර සංවර්ධන නිලධාරීන් එකම රාජකාරී ඉටුකරනු ලබන බැවින් එම තනතුරු පුරපුපාඩු ඒකාබද්ධව පවත්වා ගෙන යාමට කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලැබී ඇත.

6.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (Rs'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
			දේශීය	විදේශීය		
රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකයන් සඳහා විනය කාර්යාලීය ආචාර විධි	05	දින 02	42,500.00		දේශීය	සේවකයින්ගේ කාර්යක්ෂමතාවයේ වර්ධනයක් ලබා ගැනීමට හැකි අතර ඉහල නිලධාරීන් වෙත ඔවුන්ගෙන් මනා සේවයක් ලබා ගැනීමට හැකිවීම
Capacity Building on Research and Data Analysis Using SPSS	03	දින 04	30,000.00		දේශීය	SPSS for successful data/statistical analysis career
රජයේ වැටුප් සැකසීම	02	දින 03	36,000.00		දේශීය	රජයේ වැටුප් සැකසීම පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම
රියදුරු මහතුන්ගේ කාර්යක්ෂමතාව වර්ධනය කිරීම.	01	දින 02	8,500.00		දේශීය	සේවකයින්ගේ කාර්යක්ෂමතාවයේ වර්ධනයක් ලබා ගැනීමට හැකි අතර ඉහල නිලධාරීන් වෙත ඔවුන්ගෙන් මනා උපකාරක සේවයක් ලබා ගැනීමට හැකිවීම
How to Prepare Procurement Plan and Action Plan	02	දින 03	30,000.00		දේශීය	Gain an understand of the preparing Procurement Plan and Action Plan
විශ්‍රාම වැටුප් සම්බන්ධ වැඩමුළුව	02	දින 01	10,000.00		දේශීය	විශ්‍රාම වැටුප් සම්බන්ධ ක්‍රියාවලිය පිළිබඳව අවබෝධයක් ලබා ගැනීම
ICA-Japan Training Course on "Fostering Leaders for Management & Development of Agricultural Cooperative of Asia 2019	01	දින 45		268,327.92	විදේශීය	

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කරගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූලනොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යොජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ / ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාල නොවේ		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නොවේ		
1.6	වෙනත්			
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාල නොවේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අදාල නොවේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතන තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතන තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		

3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශය සඳහා නිලධාරීන් අනුයුක්ත කර නොමැත	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NDB) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශය සඳහා නිලධාරීන් අනුයුක්ත කර නොමැත	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල නොවේ		
6.3	2018 අංක 19 දරණ විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපති වරයාට ඉදිරිපත් කිරීම	අනුකූල නොවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම			
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඊහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය	අනුකූල වේ		

	සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියකු පත් කිර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොමිස්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලේචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එමශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කිරීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රදිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		

12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම් යාවත් කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලේචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.317 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අදාල නොවේ		
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අදාල නොවේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාල නොවේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම	අනුකූල වේ		
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබාදීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳව තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		

17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතනය විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල නොවේ	පැවති කොවිඩ් 19 වසංගත තත්වය තුල අදාළ පුහුණු කටයුතු සිදු කිරීමට නොහැකි වීම	
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම්	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන්සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		